# යෞවනයන්ට අත දිය හැකි මං

## තරුණ සහභාගිත්වයෙන් සංවර්ධනය කරා

පර්යේෂණ හා පුහුණුකිරීමේ
නිලධාරි
එල්. ඩී. අයි. විජේතුංග
විසිනි.

සංවර්ධනය යන සංකල්පය අද පුළුල් ලෙස භාවිතා වෙන්නක්. සෑම සමාජීය විද්‍යාඥයෙකුගේම අවසාන අරමුණ ජනතාවගේ සුබසාධනය උසස් තත්ත්වයකට පමුණුවාලීමයි. මෙම ක්‍රියාදාමයේදී ඒ සඳහා ජනතාවගේ සහභාගීත්වය විවිධ මට්ටමෙන් සිදුවන්නකි. දියුණුවෙමින් පවතින රටවල මෙම ක්‍රියාදාමය සංකීර්ණ ප්‍රශ්න රාශියක් වටා ගෙතී පවතී. සම්පත් හිඟතාවයට අමතරව ජනගහනය සීඝ්‍රලෙස ඉහලයාම සුබසාධනයේ අපේක්ෂිත ඉලක්කයන් වෙත යෑමට ඇති හැකියාව සීමා කරවති. යැපීමේ කොටස් වැඩිවෙත්ම මෙම ගැටළුව තව දුරටත් ප්‍රබල කරවයි. "තාක්ෂණය" සංවර්ධනය කෙරෙහි වැඩි කාර්යභාරයක් කලා වුවද, ජනතාවගේ සහභාගීත්වයෙන් තොරව, සංවර්ධනයක් ගැන කථා කිරීම නොමඟයවන සුළුයි. මෙම සහභාගීත්වයේදී, තරුණ කොටසගේ කාර්යභාරය සහ ඔවුන් සහභාගී කරවා ගැනීමට සමාජ ආර්ථික පසුබිම කෙසේ සකස් විය යුතුද යන්න කෙරෙහි විමසිලිමත් විය යුතුය. තරුණ කොටස් සංවර්ධනයේ ප්‍රබල කොටස් ලෙස සලකාගෙන ප්‍රතිපත්ති සකස් කළ යුතුවේ. ඔවුනගේ දැනුම හා ශක්තිය සුබසාධක ඉලක්කය සාර්ථක කර ගැනීමට ඉවහල් කරගත යුතුය.

සංවර්ධනයේදී මෙවැනි ක්‍රියා පිළිවෙත් සිදුවිය යුතුව තිබුනද පවතින සමාජ-ආර්ථික සබඳතාවයන් මෙම "මූලික ක්‍රියාදමය" වෙත තරුණයන් ඵලදයි අංශ වෙත සහභාගී කරවා කටයුතු කිරීමට ඇති ඉඩ ප්‍රස්ථා විවිධ හේතු මත සීමාවී පවතී. මෙය හුදෙක් සම්පත් නිසා තෝරාගත හැකි මාර්ගවල ප්‍රශ්නයක් ලෙස පමණක් නොව, තරුණ උවමනාවන් සහ හැකියාවන් නිවැරදිව හඳුනාගෙන එය සංවර්ධන ක්‍රියාදාමයෙහි කොටස් කරුවන් ලෙස සහභාගිකරවා නොගැනීම පිළිබඳ ප්‍රශ්නයකි.

"තරුණ අසහනය" යන පළල් නමින් හඳුන්වන මෙම ගැටළුව වැඩිහිටි පාම්පරාගේ දැනුම සහ තරුණ යුගයේ ඔවුන් ලබාගත් අත්දැකීම් මත පිහිටා "නූතන තරුණ ගැටළු" විසඳීමට යෑම මෙම ප්‍රශ්නය තවදුරටත් අවුල් කරන්නක් වේ. මූලික මිනිස් වුවමනාවන් වන ආහාර, ඇඳුම් සහ නිවහනක් අවම වශයෙන් හෝ ලබා නුදුනහොත් ඒ තුලින් මතුවන ගැටලුව සහ ප්‍රතිඵලය "මුළු සංස්කෘතියම" බිඳ වැටෙන්නක් ලෙස සලකා, එය ගැන අවධානය යොමු කරමින් මෙම ප්‍රශ්නයට පිළිතුරු සොයා ගත යුතුය. ශ්‍රී ලංකාව වැනි අඩු ආදයම් රටක් මෙවැනි පූර්ව නිගමන වෙත ඒමේ තත්ත්වයන් නොතිබුනා වුවද ඉදහිට ඇතිවන සිද්ධීන් මෙවැන්නකට පසුබිම සකස් කරනවාද යන්න සොයා බැලිය යුතුවේ.

විවිධ විදේශ වෙළඳ පොළවලින් ලබාගන්නා රට සල්ලිවලට අමතරව මෑතකදී "මැද පෙරදිග" රටවලින් ගලා එන 'සම්පත්' අප රටවලට ලැබෙන අමතර ආදයමකි. කුමන හෝ තරාතිරමේ සේවාවක් උදෙසා තම මව්බිමෙන් පිටව යන තරුණ කොටස් කෙටි කාලයක් තුළදී විශාල ධනයක් ඒකරාශී කරගෙන තම රටවෙත පෙරලා එන මොවුහු, ඔවුනගේ ආදයම කුමන අංශවෙත ගලා යනවාද යන්න විමසිලිමත්ව අධ්‍යයනය



මෙලෙස සාමූහිකව ඇතිවන තරුණ සහභාගිත්වය තුළින් ඔවුන් සංවර්ධනයට යොමු කළ හැකිය.

කලහොත් එය දිගුකාලීන සංවර්ධන ක්‍රියාදළයේ ප්‍රගතියට කිසිසේත් හිතකර නොවේ. මෙය අපගේ රටවල් කෙරෙහි තීරණාත්මකව බලපායි. "බටහිර පොප් සංස්කෘතිය" සහ "මැද පෙරදිග ප්‍රදර්ශනකාරි සංස්කෘතිය" තවදුරටත පෝෂණය කිරීමට, පවතින විවෘත ආර්ථිකයේ යම් යම් අංශ අනුබලයක් දෙයි. විවෘත ආර්ථිකයේ වාසි සහගත තත්වයන් වෙත තම ඉතිරිකරගත් මුදල් නොයොදවා තරුණ ආවේග උද්දීපනය වන ආකාරයේ නිස්සාර අංශ වෙත ඔවුහු මුදල් යොදවති. මෙය එක් පැත්තකින් සංවර්ධන ක්‍රියාදමයේදී ගැමි සමාජ-ආර්ථික පසුබිමෙන් ලබාගත් හරයන් කෙටි කාලීන පැවැත්ම සඳහා සම්පත් නාස්තිකරවන්නක් ලෙස පෙන්වා දිය හැකි අතර, එය මෙතෙක් ලබා ගත් 'සංවර්ධනය' විකෘති කර වන්නකි.

රැකියාවක් නොමැති තරුණයා තම පරාධීනභාවය තුලින් සමාජය තුල විවිධ විකෘති ක්‍රියාකාරකම් වෙත පෙළඹේ. නිරන්තරයෙන්ම ඔහු/ඇය තුල පවතින ශක්තිය කිසියම් කාර්යයක් වෙත යොමු කිරීමට මාර්ග සොයමින් සිටියි.

සංවර්ධන ක්‍රියාදමය තුල දැකිය හැකි තවත් අංශයක් වනුයේ පහල ආදායම් පංතිය, ඉහළ ආදායම් පංතිය අනුකරණයේ යෙදීමයි. අනුකරණයේ තරුණයා තුල තිබෙන ස්වභාවික ක්‍රියාදමයකි. නමුත් ඒ තුලින් පිලිලයක් මෙන් ගොඩනැගෙන "ප්‍රදර්ශනකාරී භාවය" දීර්ඝකාලීන පැවැත්මට හිතකර නොවේ. එහි ප්‍රතිඵලය "තරුණ සම්පත්" සංවර්ධන ක්‍රියාදමයෙන් ඉවතට තල්ලු වී යාමය. සංවර්ධනයේදී කිසියම් සමාජ සංස්ථාවක් එම ක්‍රියාදමයට බාධා පමුණුවයි නම්, එම අංශය මැනවින් හඳුනා එයට අවශ්‍ය පිළියම් යොද ගත යුතුවේ. උදාහරණයක් වශයෙන් "තරුණ දේශපාලනය" ගතහොත් එහි පවතින හරවත් බව මතුකර ගත යු යි. මන්දයත් සමාජය දේශපාලන සම්බන්ධතාවකින් තොරව ක්‍රියාත්මක කිසිම කොටසක් ගැන හෝ සිතීම දුෂ්කර බැවිනි. මේ සඳහා කාලය හා ශක්තිය තිබෙන තරුණ කොටස් වෙත අවශ්‍ය සම්පත් හා පසුබිම ලබාදීම සමාජ සංවිධාන වල මූලික කාර්ය භාරයන් වේ.



සැලසුම් සකස් කිරීමේදී තරුණ කොටස්වල සහභාගීත්වය ප්‍රමුඛ විය යුතුය. ඔවුනට තීරණ ගැනීමට අවශ්‍ය බලය, පවතින සංවිධාන තුලින් ලබා දිය යුතුවේ. ප්‍රතිපත්ති "ඉහළ මට්ටමෙන්" නොව බහු කොටසගේ නියෝජනය වන තරුණයාගේ මට්ට මෙන් ක්‍රියාත්මක කල යුතුවෙ විශේෂයෙන් ගොවි සංවිධාන තුල තරුණ නායකත්වය හඳුනා ගත යුතු වේ. සංවර්ධනය ක්‍රියා දමයේදී, සමාජයේ පෙරදිග රටවල පවතින සාරධර්මයක් වනුයේ එක් පැත්තකින් දෙමපියන්ගෙන් දරුවනට ලැබෙන ධනයත් අත් අතට දරුවන්ගෙන් දෙමව්පියන් වෙත පෙරලා ලැබෙන සමාජ-ආර්ථික වාසියත්ය. පෙරදිග රටවල දරුවන් දෙමව්පියන් අතර පවතින සබඳතාවය බටහිර රටවලට වඩා දැඩිය. මෙම තත්ත්වයන් නිසාම ඔවුනට අවශ්‍ය නිදහස, අධිකාරිය සහ ස්වශක්තිය පිළිබඳ හැඟීම ලබා දීම තුලින් ඔවුන්ගේ සංවර්ධන සහභාගීත්වය ශක්තිමත් කළයුතුය. සංවර්ධනය පිළිබඳ තරුණ සහභාගීත්වය සම්ප්‍රදයික විශ්ලේෂන විධි නම් ප්‍රමාණවත් නොවේ. ගැමි සහා නාගරික තුල වෙසෙන තරුණ කොටස්වල සමාජ-ආර්ථික වෙනස්කම් හඳුනාගෙන ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී හුදෙක් නගරයට නැඹුරු වූ ක්‍රමයක් ගැන පමණක් නොව, ගමට නැඹුරුවූ සම්පත් ගලායන ක්‍රමයක් ලෙස සකස් විය යුතුය.

ඒකරාශිවී ඇති බලය, තරුණයන් අත පැවරීමේදී ඔවුනගේ තරාතිරම සහ අයිතිවාසිකම් වගකීමක් ඇතිව භාරදිය යුතුවේ. ගමේ සම්පත් ප්‍රයෝජනයට ගැනීමේදී ගමේ අතිරේක තරුණ කොටස් සම්බන්ධ වන ආකාරයෙන් ප්‍රතිපත්ති සකස් කල යුතුය. ග්‍රාමීය සම්පත් හැකි තාක් දුරට, ගම පදනම් කරගෙන ආරඹන කුඩා කෘෂි ව්‍යාපාරතුල ගොනුකළ යුතුය. දේශීය වෙළඳ පොල මගින් පිටරට ඇදියන ධනස්කන්ධය මෙම රටේ රඳවා පවත්වා ගැනීමට නම් තරුණ කොටස් සහභාගීත්වයෙන් ව්‍යාපාර කටයුතු ආරම්භ කළ යුතුවේ. මෙහිදී මූලික වශයෙන් හඳුනාගත යුතු වනුයේ "නිලධාරි වාදය" සහ එය තරුණ කොටස් කෙරෙහි බලපාන ආකාරයකි. මෙහි පරතරය වැඩිවත්ම සංවර්ධන ක්‍රියාදම යේදී තරුණ සහභාගීත්වයසීම වේ. ඔවුනට තමා සංවර්ධන ක්‍රියාදමයට ඇතුල්වීම තුලින් තමාගේ සුබසාධනය වැඩිවනවාය යන අදහස ඔවුන් වෙත ඒත්තු ගැන්වියයුතුය. එහිදී තරුණ කොටස්වල නියෝජිතයෙක් "අධිකාරියක්" පිටුවා එය පදනම් කරගෙන, විවිධ ජන මාධ්‍යයන් භාවිතා කරමින් සංවර්ධනයේදී, තරුණයන්ගේ කාර්ය භාරය සහ එය සංවර්ධනය ක්‍රියාදමයේදී සහභාගිකරවා ගත හැකි මාර්ග පෙන්වා දිය යුතුය.